# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2415/54 - 2024 දෙසැම්බර් මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2024.12.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 15/2024

**2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත**

**32 වැනි වගන්තිය යටතේ වූ නියමය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (3) වැනි අනු ව්‍යවස්ථාව සමග කියවිය යුතු 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 32 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති අනුර කුමාර දිසානායක වන මම, මෙහි උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල ලැයිස්තුගත කර ඇති වගන්තිවල විධිවිධාන සලස්වා ඇති ආකාරයට මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති බලතල, මෙම නියමය මගින් භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත මෙයින් පවරා දෙමි.

**අනුර කුමාර දිසානායක,**
ජනාධිපති.

2024 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

| | *I වන තීරය* | *II වන තීරය* |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත දේශීය හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ණය ගැනීමේ සහ ණය සුරැකුම්පත් නිකුත් කිරීමේ බලය. | 12 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය |
| 2. | (අ) ශ්‍රී ලංකා රජය විසින් ලබාගන්නා විදේශ ණය සම්බන්ධ ගිවිසුමක්;<br>(ආ) රාජ්‍ය සංස්ථාවකට හෝ පොදු ව්‍යවසායකට විදේශ ණයක් ලබාගැනීමට ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙන ඇපකරයන්;<br>(ඇ) ශ්‍රී ලංකා රජය විසින් එළඹිය යුතු එවැනි ගිවිසුමක් හෝ ඇපකරයක් සඳහා අවශ්‍ය ඕනෑම කොන්ත්‍රාත්තුවක්, බැඳුම්කරයක් පොරොන්දු පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක්,<br>අත්සන් කිරීමට. | 12 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය |

EOG 12 – 0203

1A - G 43321 - 06 (2024/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*